# විදේශ විනිමය දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

# 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 03 දරන විධානයන්

---

## පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 03 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ) නියෝගය සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9(1) සහ 9(2) වගන්ති ප්‍රකාරව, පහත කොන්දේසිවලට යටත්ව පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන් වෙත මෙයින් අවසර දෙනු ලැබේ.

### 1.1 සුදුසුකම්ලත් පුද්ගලයන්

සුදුසුකම්ලත් පුද්ගලයන් නියෝගයෙහි සඳහන් පරිදි වියයුතුය.

### 1.2 ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම

නියෝගය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදී ඇති අධිකාරිය ප්‍රකාරව, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමේදී නියෝගයෙහි සඳහන් කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසි ද සැළකිල්ලට ගත යුතුය.

(අ) තාවකාලික සංචාරයක් මත ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවට පැමිණීමටඅදහස් කරන විජාතිකයන්, මෙම ගිණුම් බද්ධ ගිණුම් ලෙස විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට සුදුසුකම් නොලබයි.

(ආ) ශ්‍රී ලාංකික ජාතිකයෙකු වන හෝ ශ්‍රී ලාංකික සම්භවයක් සහිත ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකු වන බාලවයස්කරුවකුගේ නමින් පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට ඇති අවස්ථාවකදී, එම ගිණුම් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකු වන ඔවුන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන්ගෙන් ලද විදේශ විනිමය ප්‍රේෂණ බැර කිරීමෙන් හෝ දෙමව්පියන් හෝ භාරකරුවන්ගේ දැනට පවත්නා පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් අරමුදල් මාරු කිරීමෙන් පමණක් විවෘත කළයුතුය.

(ඇ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් විවෘත කිරීමට පෙර පහත සඳහන් තොරතුරු සහ ලියකියවිලි අදාළ පරිදි ලබාගත යුතුය.

| | සුදුසුකම්ලත් පුද්ගලයන් | තොරතුරු/ලේඛන |
|---|---|---|
| I | බාලවයස්කරුවෙකු ද ඇතුළුව, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකු වන, ශ්‍රී ලාංකික සම්භවයක් සහිත පුද්ගලයෙකු | • සම්පූර්ණ නම, ජාතිකත්වය හා විදේශ ලිපිනය<br>• විදේශ ගමන් බලපත්‍ර අංකය, නිකුත් කළ දිනය සහ වලංගු කාලසීමාව<br>• ශ්‍රී ලංකාවෙන් පිටත් වූ දිනය<br>• පුරවැසිභාවය හෝ විදේශ රජයකින් පිරිනමන ලද වීසා බලපත්‍රයේ ස්වභාවය |
| II | විජාතිකයෙකු වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු | • සම්පූර්ණ නම, ජාතිකත්වය හා විදේශීය ලිපිනය<br>• ශ්‍රී ලංකාවේ රැකියා ස්ථානයේ ලිපිනය සහ තනතුර, ඇත්නම්<br>• සේවා නියුක්ති ගිවිසුමේ පිටපතක් සහ වැටුප් විස්තර<br>• විදේශ ගමන් බලපත්‍රයේ හා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද වීසා බලපත්‍රයේ පිටපත් |
| III | තාවකාලික සංචාරයක් මත ශ්‍රී ලංකාවට පැමිණි හෝ ශ්‍රී ලංකාවට පැමිණීමට අදහස් කරන විජාතික තැනැත්තෙකු | • සම්පූර්ණ නම, ජාතිකත්වය හා විදේශීය ලිපිනය<br>• විදේශ ගමන් බලපත්‍රයේ සහ වීසා බලපත්‍රයේ පිටපත් |

### 1.3 අවසරලත් බැර කිරීම්

අවසරලත් බැර කිරීම් නියෝගයෙහි සඳහන් පරිදි විය යුතුය.

### 1.4 අවසරලත් හර කිරීම්

නියෝගය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදී ඇති අධිකාරිය ප්‍රකාරව, නියෝගයෙහි සඳහන් කරන ලද හර කිරීම්වලට අමතරව පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට පහත සඳහන් හර කිරීම් සඳහා ද අවසර ඇත.

(අ) ගිණුම් හිමියාගේ විදේශ ව්‍යවහාර මුදල් ණය ගිණුමකට (FCLA) හෝ රුපියල් ණය ගිණුමකට (LLA) අරමුදල් මාරු කිරීම

## 2. මාසික වාර්තා කිරීම්

(අ) බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම I හි පරිදි මාසික පදනමින් සකස් කළ වාර්තාවක් එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට ප්‍රථම dfem@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළයුතුය.

(ආ) ඉහත වාර්තාව සැපයීම සඳහා අදාල තොරතුරු බැංකුවල ගිණුම් පොත්වලින් උත්පාදනය/උපුටා ගැනීම පිණිස බලයලත් වෙළෙඳුන් විසින් බැංකුව තුළ නිසි පද්ධතියක් ක්‍රියාත්මක කළයුතුය.

**අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව**

2017 නොවැම්බර් 20 වැනි දින

2017 අංක 3 දරන විධානය සඳහා වූ ඇමුණුම 1

## පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳ මාසික ප්‍රකාශනය

බැංකුවේ නම:
වාර්තා කරන මාසය සහ වර්ෂය :

| මුදල් වර්ගය | ගිණුම් හිමියන්ගේ නේවාසික භාවය | ආරම්භක ශේෂය | | බැර | | | | | හර | | | | අවසාන ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගිණුම් ගණන | වටිනාකම | පිටරටින් ලද ආමුඛ ප්‍රේෂණ | වෙනත් ගිණුම්වලින් කරන ලද හුවමාරු කිරීම් | බැර කරනු ලද මුළු පොළිය | අනෙකුත් බැර කිරීම් | එකතුව | ශ්‍රී ලංකාවෙන් පිටතට සිදු කරන ලද ප්‍රතිමුඛ ප්‍රේෂණ | වෙනත් ගිණුම්වලට කරන ලද හුවමාරු කිරීම් | අනෙකුත් හර කිරීම් | එකතුව | ගිණුම් ගණන | වටිනාකම |
| ඇ.එ.ජ. ඩොලර් | නේවාසික | | | | | | | | | | | | | |
| | අනේවාසික | | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | | | |
| ස්ටර්ලිං පවුම් | නේවාසික | | | | | | | | | | | | | |
| | අනේවාසික | | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | | | |
| යූරෝ | නේවාසික | | | | | | | | | | | | | |
| | අනේවාසික | | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | | | |
| වෙනත්* නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් | නේවාසික | | | | | | | | | | | | | |
| | අනේවාසික | | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | | | |

* වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සඳහා ඔබට අවශ්‍ය පරිදි පේළි දීර්ඝ කළහැකිය.

බලයලත් වෙළෙඳුන් විසින් ඉහත වාර්තාවෙහි පරිලොකන පිටපත් සහ එම්එස් එක්සෙල් මගින් සකස් කරන ලද වාර්තාවක් සැපයිය යුතුය.

බැංකුවේ ගිණුම් පොත් මගින් උපුටාගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බවට අපි සහතික වන්නෙමු

බලයලත් නිලධාරියාගේ නම :
අත්සන :
දිනය :

අනුකූලතා නිලධාරියාගේ නම :
අත්සන :
දිනය :